**ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය - 2015**

**---------------------------------------------------**

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතන පනතේ 14(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 **විගණකගේ වගකීම**

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා

යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02**

ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලැබී තිබූ රු. 2,130,000 ක් වටිනා වාහනය මූල්‍ය ප්‍රදාන ලෙස සලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහ යටතේ මුදල් ගලා යාමක් හා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහ යටතේ මුදල් ගලා ඒමක් ලෙස දක්වා තිබුණි.

(ආ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

**-------------------------------------------**

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.8,088,767 ක්වූ වත්කම් අයිතම් 205 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වුවද 2015 වර්ෂයේදී ආයතනයේ වත්කම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට රු. 822,480 ක් ගෙවා තිබුණද තක්සේරු වාර්තා මෙතෙක් ලබාගෙන නොතිබුණි.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පරිගණකගත සේවක මණ්ඩල කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ගෙවන ලද අත්තිකාරම් මුදල වූ රු. 61,200 ක් අත්තිකාරම් ලෙස නොදක්වා, අනිකුත් මූල්‍ය නොවන ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) බැංකුවක තැන්පත්කර තිබූ ස්ථාවර තැන්පතුවට අදාලව ලැබිය යුතු පොලී රු.129,923 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු මහන මැෂින් වෙනුවෙන් ගෙවා තිබුණු රු.3,597,880 ක් වූ එකතුකළ අගය මත බදු මුදල, නිමවුම් බද්දෙන් හිලව් කිරීම වෙනුවට ප්‍රාග්ධනිත වියදමක් ලෙස සලකා ගෘහශ්‍රිත ඇඟළුම් කර්මාන්ත ව්‍යාපෘති ගිණුමට හර කර තිබුණි.

2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 20,212,785 ක් වූ ලැබිය යුතු ශේෂයෙන් රු. 4,771,861 ක් වසර 02 කට වැඩි කාල පරිච්ඡේදයක සිට අයනොවී පැවතුණි.

(ආ) 2011 වර්ෂයේදී ආයතනය පිහිටුවීමේදී ඒකාබද්ධ කරන ලද පේෂකර්ම අභ්‍යාස හා සේවා මධ්‍යස්ථානයේ ගිණුම්වලින් ඉදිරියට ගෙන එන ලද එකතුව රු. 290,441 ක් වූ ලැබිය යුතු එකතු කළ අගය මත බදු මුදල ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.5 වගන්තිය අනුව අමාත්‍ය මණ්ඩලය හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, ඉංජිනේරු දීමනා, පාසල් දීමනා, පාඨමාලා සම්බන්ධීකරණ දීමනා හා ගණකාධිකාරී දීමනා ලෙස 2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් එකතුව රු.2,546,519 ක් හා රු.2,296,108 ක් වශයෙන් මුළු එකතුව රු.4,842,627 ක් ගෙවා තිබුණි.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1. මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 2,426,420 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.46,235,868 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.43,809,448 ක පිරිහීමක් වූ අතර, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.30,235,595 කින් අඩුවීම සේවක පඩිනඩි හා සේවක ප්‍රතිලාභ වියදම් එකතුව රු. 17,147,078 කින් වැඩි වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵලය විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා උච්චාවචනයක් සහිතව මූල්‍ය අතිරික්තයක් පෙන්නුම් කර තිබුණි. සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී

ආයතනයේ දායකත්වය 2011 වර්ෂයේ රු.69,374,663 සිට 2014 වර්ෂයේදී රු.137,931,510 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණු අතර 2015 වර්ෂයේදී රු.111,088,905 ක් දක්වා පිරිහී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතන පනත අනුව, පේෂකර්ම හා ඇඟළුම් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා පුද්ගලයින් පුහුණු කිරීම, පරීක්ෂණ හා උපදේශන කාර්යයන් වැනි සේවාවන් ඉටු කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යයන් වන අතර එම කාර්යයන් ඉටු කිරීමේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| කාර්යය | 2015 | 2014 | සමාලෝචිත වර්ෂයේ වැඩිවීම/(අඩුවීම) | වැඩිවීම හා (අඩුවීම) ප්‍රතිශතය |
|---|---|---|---|---|
| **පුහුණු කිරීම්** | | | | |
| පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 62 | 24 | 38 | 158 |
| සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 890 | 372 | 518 | 139 |
| පුහුණු පාඨමාලා ආදායම (රු. මිලියන) | 40.83 | 13.34 | 27.49 | 206 |
| **බාහිර පාර්ශවයන්ගේ ඉල්ලීම අනුව** | | | | |
| පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 89 | 120 | (31) | (26) |
| සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 3,512 | 3,947 | (435) | (11) |
| පුහුණු පාඨමාලා ආදායම (රු. මිලියන) | 30.60 | 42.94 | (12.34) | (29) |
| **පරීක්ෂණ** | | | | |
| පරීක්ෂණ සංඛ්‍යාව | 39,424 | 65,031 | (25,607) | (39) |
| පරීක්ෂණ ආදායම (රු. මිලියන) | 43.9 | 83.58 | (39.68) | (47) |
| **උපදේශාත්මක සේවා** | | | | |
| උපදේශාත්මක සේවා සංඛ්‍යාව | 10 | 16 | (6) | (38) |
| උපදේශාත්මක සේවා ආදායම (රු. මිලියන) | 3.5 | 1.1 | 2.4 | 218 |

(අ) 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා 111 ක් පැවැත්වීම සඳහා සිසුන් 1437 ක සහභාගිවීමක් අපේක්ෂා කළද, වර්ෂය අවසන් වන විට පාඨමාලා 62 ක් පමණක් පවත්වා තිබුණි. ඒ සඳහා සිසුන්ගේ සහභාගිත්වය 890 ක් වී තිබුණි. මේ අනුව පවත්වන ලද පාඨමාලා සහ සිසු සහභාගීත්වයේ ප්‍රගතිය, ක්‍රියාකාරී සැලැස්ම හා සැසඳීමේදී පිළිවෙලින් සියයට 56 ක් හා සියයට 62 ක් විය. එබැවින් 2015 දෙසැම්බර් 31 දින වන විට ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු නොකිරීම නිසා ඉලක්කගතව තිබූ රු.59,337,000 ක පාඨමාලා ආදායමින් උපයාගත නොහැකි වූ ආදායම් එකතුව රු.18,501,510 ක් විය. එය ඉලක්කගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 31 කි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී බාහිර පාර්ශවයන්ගේ ඉල්ලීම අනුව පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව පෙර වර්ෂයට වඩා 31 කින් අඩු වී තිබුණ අතර එම හේතුවෙන් පාඨමාලා ආදායමද, රු. මිලියන 42.94 සිට රු. මිලියන 30.60 දක්වා සියයට 29 කින් අඩු වී තිබුණි.

(ඇ) ආයතනය විසින් සැලසුම් කරන ලද පාඨමාලා පැවැත්වීම, ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සිදු වී නොතිබුණු අතර ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා පාඨමාලා සංවිධානය කිරීම, ක්ෂේත්‍රයේ නියුතු වූවන් අතර ප්‍රවර්ධන වැඩපිළිවෙලවල් ප්‍රමාණවත් ලෙස ක්‍රියාත්මක කිරීම හා එක් එක් පුහුණු අංශවල ප්‍රගතිය පිළිබඳව වරින්වර පාලක මණ්ඩලයේ අවධානයට යොමු කිරීම යන අරමුණු ඉටුකරගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂණ සංඛ්‍යාව හා ආදායම, පෙර වර්ෂය හා සැසඳීමේදී පරික්ෂණ සංඛ්‍යාව 25,607 කින් හා පරීක්ෂණ ආදායම රු. මිලියන 39.68 කින් හෙවත් සියයට 47 කින් අඩු වී තිබුණි. පාසැල් නිල ඇඳුම් පරීක්ෂණ ආදායම පෙර වර්ෂයට වඩා රු. මිලියන 35.30 කින් අඩුවීම මේ සඳහා විශේෂයෙන් බලපා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය 2009 දී ස්ථාපිත කොට 2015 වසර අවසන් වන විට වසර 06 ක් ඉක්ම ගොස් තිබුණද, 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතන පනතේ 01 කොටසේ 04 (අ) ඡේදය ප්‍රකාරව පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රය පිළිබඳව පශ්චාත් උපාධි සහ ප්‍රථම උපාධි වැඩසටහන් පැවැත්වීමට 2015 දෙසැම්බර් 31 දින වන විටත් අවශ්‍ය වැඩපිළිවෙල සකස් කර නොතිබුණි.

(ඊ) ජාත්‍යන්තර හා ජාතික ප්‍රමිතිවලට සහ සමාගම් ප්‍රමිති පද්ධතිවලට අනුකූලව පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ නියැලී සිටින තැනැත්තන්ට අනුකූලතා සහතික නිකුත් කිරීම, ආයතනයේ පරමාර්ථයක් වුවද, ආයතනය මගින් පවත්වාගෙන යන පාඨමාලා සඳහා ජාතික වෘත්තිය මට්ටමේ සුදුසුකම් තත්ත්වය (NVQ) ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ධාවනය කිරීමට නොහැකි තත්ත්වයේ ජීප් රථයක් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් 2014 වර්ෂයේ නොවැම්බර් මාසයේ තාවකාලික පදනමට

ආයතනයට ලබාගෙන ඒ සඳහා රු. 362,175 ක් අලුත්වැඩියා වියදම් ලෙස ආයතනය විසින් වැය කර තිබුණි. නමුත් මෙම වාහනය ධාවනය කළහැකි තත්ත්වයට පත් වී නොතිබුණු බැවින් නැවත අමාත්‍යාංශය වෙත භාර දී තිබු අතර අලුත්වැඩියාව සඳහා වැය කරන ලද මුදල කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනය වෙත 1991 හා 1997 වර්ෂවලදී ප්‍රදානයන් ලෙස ලැබී තිබු වාහන 02 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන් රු.1,500,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ඇස්තමේන්තු කර තිබුණද භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව විදේශ පුහුණු සඳහා වියදම් දැරීම නිසා විදේශ පුහුණු සඳහා වැය කරන ලද රු. 1,098,500 ක මුදල භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඈ) 2012 සහ 2014 වර්ෂවලදී අස්ථානගත වී තිබුණු එකතුව රු.400,223 ක් වූ පරිගණක 3 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගැනීමට සහ ගිණුම් වල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකාවේ නියෝජිත ආයතනයක් මඟින් විද්‍යා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2014 ඔක්තෝබර් 15 දින විවෘත කරන ලද ණයවර ලිපියක කාලය දීර්ඝ කිරීම, අදාල කොමිස් හා ටෙලෙක්ස් ගාස්තු වෙනුවෙන් එකතුව රු. 63,413 ක් වැයකර තිබුණද, මෙම විද්‍යා උපකරණ 2016 ජූලි 31 දින වන විටත් ආයතනය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---

පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් රු.30,000,000 ක් සහ ආයතනය විසින් රු.15,000,000 ක් වැයකර මඩකලපුව දිස්ත්‍රික්කයේ පාලමුනෙයි ප්‍රදේශයේ ඉදිකරන ලද පේෂකර්මාන්ත නිර්මාණ පුහුණු වර්ණ ගැන්වීමේ සහ අලෙවි මධ්‍යස්ථානය සඳහා කාර්ය භාර නිලධාරියෙකු හා බොයිලේරු ක්‍රියාකරුවෙකු බඳවාගැනීම හා අදාල කටයුතු පිළිබඳ ආයතනයේ නිලධාරීන් පුහුණු කිරීමට කටයුතු කර නොතිබීමෙන් කර්මාන්තයේ නියුතු වූවන්ට සහන මිලට නූල් සැපයීම, සාධාරණ මිලට අත්යන්ත්‍රවලට අවශ්‍ය අමතර කොටස් සහ අනෙකුත් උපකරණ සැපයීම, ගුණාත්මක පරීක්ෂණ සේවාවක් සැපයීම, දේශීය කර්මාන්ත කරුවන්ට අලෙවි අවස්ථා හා අපනයන ප්‍රවර්ධන අවස්ථා ඇති කිරීම, මධ්‍යස්ථානය තුළ පර්යේෂණ හා පුහුණු ඒකකයක් ඇති කිරීම යන අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

4.4 **මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අරමුණුවලට පරිබාහිර පුවත්පත් දැන්වීමක් පලකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.263,200 ක් වැය කර තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ xv වැනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය ප්‍රකාරව අදාල පත්වීමේ කොන්දේසි අනුව සේවයෙහි ස්ථිර කරනු ලැබීම පිණිස ලබාගත යුතු කිසියම් සුදුසුකමක් ලබා ගැනීම සඳහා මිස, පරිවාසය පිට සිටින නිලධාරියෙකු අධ්‍යයන හෝ අභ්‍යාස සඳහා පිටරට නොයැවිය යුතු බව දක්වා ඇතත්, පරිවාස කාලය තුළ සිටි ආයතනයේ නිලධාරීන් හතර දෙනෙකු පිටරට පුහුණු පාඨමාලා හා සම්මේලනයක් සඳහා සහභාගි කරවා ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.442,648 ක් වැයකර තිබුණි.

(ඇ) ආයතනයේ නිලධාරීන් සාමාජිකත්වය දරනු ලබන විවිධ වෘත්තිය ආයතනයන්ට ගෙවිය යුතු වාර්ෂික සාමාජික ගාස්තු සඳහා පාලක මණ්ඩලයේ අනුමැතියක් නොමැතිව සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.101,257 ක් ගෙවා තිබුණි.

(ඈ) පාලක මණ්ඩලයේ අනුමැතියකින් තොරව ආයතනයේ නිලධාරීන් විසින් හදාරනු ලැබූ පශ්චාත් උපාධි සහ විවිධ පාඨමාලා සඳහා නිලධාරින්ගේ ඉල්ලීම මත පාඨමාලා ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ආයතනය විසින් රු.555,201 ක් ප්‍රතිපූර්ණය කර තිබුණි.

4.5 **වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්**

2012 වර්ෂයේදී ආයතනය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු රු.7,500,000 ක් වටිනා කැබ් රථය 2003 ජුනි 02 දිනැති අංක පීඑෆ් /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව රේගු අමාත්‍යාංශයේ භාවිතය සඳහා 2013 සැප්තැම්බර් 04 දින නිදහස් කර තිබුණු අතර එම වාහනයේ අලුත්වැඩියා වියදම් ලෙස එකතුව රු.910,472 ක් ආයතනය විසින් දරා තිබුණ නමුත් එම මුදල, අමාත්‍යාංශය වෙතින් ලබාගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

4.6 **ආර්ථික නොවූ ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ නිලධාරියකු ඉන්දියාවේ පැවැත්වෙන ශිෂ්‍යත්ව වැඩසටහනකට සහභාගිවීමේ වියදම් වෙනුවෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනය වෙත රු.140,000 ක මුදලක් ආයතනය විසින් ගෙවා තිබුණද, හේතු නොදක්වා මෙම විදේශ සංචාරය අවලංගු කිරීම නිසා ඉහත ලබා දුන් මුදලින් රු.92,464 ක් ආයතනයට අහිමි වී තිබුණි.

(ආ) ආයතනය විසින් 2014 වර්ෂයේදී ස්ථාපිත කරන ලද මන්නාරම පුහුණු ශාඛාවේ 2015 වර්ෂය තුළ කිසිදු ආදායම් ප්‍රභවයක් නොමැතිව නඩත්තු වියදම් ලෙස රු. 1,870,111 ක් වැයකර තිබුණි. එසේම 2014 වර්ෂයේදී මෙම පුහුණු ආයතනය නඩත්තු කිරීම සඳහා රු.1,036,259 ක් ආදායම ඉක්මවා වියදම් දරා තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 මාර්තු 23 දිනැති අනුමත නව බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ක්‍රමවේදයට අනුව නිලධාරීන් බඳවා ගත යුතු වුවද එයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ කොන්ත්‍රාත් පදනම මත සේවය කළ නිලධාරීන් 09 දෙනෙකු ස්ථිර තනතුරු සඳහා පත් කර තිබුණි.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටි සංග්‍රහයේ 154 වගන්තිය ප්‍රකාරව රජයේ සේවයේ විශ්‍රාමලත් තැනැත්තන් නැවත රජයේ සේවයෙහි යෙදවීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පමණක් පැවරෙන බව දක්වා ඇතත් ඒ අනුව කටයුතු නොකොට විශ්‍රාම ගොස් සිටි නිලධාරියෙකු, පාලක මණ්ඩලයේ අනුමැතිය මත 2014 ඔක්තෝබර් 01 දින සිට කොන්ත්‍රාත් පදනම මත වර්ෂයක කාලයක් සඳහා උපදේශකවරයෙක් බඳවාගෙන ඒ වෙනුවෙන් රු. 565,125 ක දීමනා ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------

## 5.1 අභ්‍යන්තර විගණනය

--------------------

වර්තමානයේ අභ්‍යන්තර විගණනය සඳහා අභ්‍යන්තර විගණකවරියක් පමණක් සේවයේ යොදවා තිබුණු අතර, ඒ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පත්කර ඵලදායි විගණනයක් සිදුකර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

## 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ආ), (ඇ) හා (ඉ) ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කොට ඊළග එළඹෙන වර්ෂය සඳහා වු ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු බව හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට නොවැඩි කාලයක් තුළ යාවත්කාලීන කළ යුතු බව දක්වා ඇති නමුත් ආයතනය ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී, සියයට 08 සිට සියයට 80 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

2012 ඔක්තෝබර් 16 දින හා 2014 අප්‍රේල් 08 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා නියෝග පරිදි ඇඟලුම් කර්මාන්තය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමට අවධානය යොමු කල යුතු බව අවධාරණය කර තිබුණද ආයතනය විසින් පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් පිහිටුවා තිබුණු නමුත්, ඇඟළුම් ක්ෂේත්‍රය පිළිබඳ මූලික සමීක්ෂණයක් සිදුකිරීමට පියවර ගැනීම හැර වෙනත් කටයුතු කිසිවක් මෙම ඒකකයෙන් මෙතෙක් සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ලැබිය යුතු ණය අයකර ගැනීම | වසර 02 කට වැඩි එකතුව රු. 4,771,861 ක් වූ ණයගැති ශේෂයන් අයකර ගැනීමේ ක්‍රියාකාරී වැඩපිළිවෙලක් නොවීම. |
| (ආ) කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම | එක් එක් තනතුරු සඳහා අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබීම. |